CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 01/2018 දරන නඩුකරය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2018 ජනවාරි මස 11 වන දින කොළඹ" ශ්‍රී ලංකාව :*** ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් සිය නිල ධූර කාලය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ මතය විමසීම සඳහා යොමු කර ඇති විමසීමට අදාළව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) තමන් වෙනුවෙන් හා එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා වෙනුවෙන් මැදිහත් වී කරුණු දැක්වීම සඳහා ඉදිරිපත් විය.

2018 ජනවාරි මස 08 වන දින" මාධ්‍ය විසින් වාර්තා කළ පරිදි ජනාධිපති සිරිසේන මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසමින් මෙසේ සිය ප්‍රශ්ණය යොමු කොට ඇත.

> *"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව ජනාධිපතිධූරයට තේරී පත් වී හා පදවිප්‍රාප්තවී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(1) ව්‍යවස්ථාවට අනුකූලව 2015 ජනවාරි 09 දින වැඩ බාරගත් පුද්ගලයකු වන මා හට එසේ ජනාධිපතිධූරය සඳහා මාගේ තේරී පත්වීම ප්‍රකාශයට පත් කළ දිනය වන 2015 ජනවාරි මස 9 දින සිට වසර 6 ක කාලයක් ජනාධිපතිධූරයේ අඛණ්ඩව කටයුතු කිරීමට කිසියම් බාධාවක් හෝ අවහිරයක් තිබේද''*

මෙම නඩුවට අදාළ කරුණු 2018 ජනවාරි මස 11 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ විමසීමට ලක් වූ අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය 2018 ජනවාරි 14 දින ජනාධිපතිවරයා වෙත භාරදීමට නියමිතව ඇත.
මෙහිලා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ස්ථාවරය වන්නේ ඉහත කරුණ සම්බන්ධයෙන් 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉතා නිරවුල්ව කරුණු සඳහන් කර ඇති බවයි; එනම් එකී සංශෝධනය ඉතා පැහැදිලිව දක්වා ඇත්තේ ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර 5 ට සීමාකර ඇති බවයි;

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2) ව්‍යවස්ථාව : *ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන අතර පස් අවුරුදු කාලයක් ධූරය දරන්නේය;*

තවද එම සංශෝධනයේ අන්තර්කාලීන විධිවිධාන අනුව වසර 5 කට සීමා කරන ලද ධූර කාලය" වර්තමාන ජනාධිපතිවරයාට ද සමාන ලෙස අදාළ වන බව පැහැදිලි ලෙසම දක්වා ඇත.

> 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 49(1)(ආ) වගන්තිය : ***එහි සැකදුරු කිරීම සඳහා*** *දක්වා ඇත්තේ 2015 අප්‍රේල් මස 22වන දිනට පෙර දින ජනාධිපතිධූරය සහ අග්‍රාමාත්‍යධූරය දරන තැනැත්තන් එම දිනෙන් පසු"* ***මෙම පනත මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ*** *විධිවිධාන වලට යටත්ව එම ධූර දැරිය යුතු වන්නේය.* ^අවධාරණය කර ඇත)

වැඩිදුරටත් 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැහැදිලිව දක්වා ඇත්තේ එම සංශෝධනයේ කොටසක් ධූරය දරන ජනාධිපති සිරිසේන මහතා සඳහා බල නොපාන බවත්" ධූරකාලය අඩුකිරීම සම්බන්ධව එම කොටසේ එවැනි විධිවිධාන නොමැති බවත්ය; (19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 51 වගන්තිය) මේ අනුව ජනාධිපති සිරිසේන මහතාගේ ධූර කාලය 2015 ජනවාරි 09 වන දිනෙන් ඇරඹී වසර 5 වනවා (උදා: 2020 ජනවාරි 09) මිස වසර 6 නොවන බවත් (උදා: 2021 ජනවාරි 09) තේරුම්ගත යුතුව ඇත; විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දක්වා සිටින්නේ 2015 දී" 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත පනවනු ලබන අවස්ථාව දක්වාම ජනාධිපති සිරිසේන මහතා විසින් වසර 5ක් වූ ධූරකාලය ඔහුට ද අදාළ වන බව ප්‍රකාශකොට ඇති බවයි. ජනාධිපතිවරයා **ඔහුගේ මෙම ප්‍රකාශයට අනුව කටයුතු කරනු ඇතැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලාපොරොත්තු වේ**; වැඩිදුරටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ දේශපාලනික ක්‍රියාකාරී කොටස් වලින් ඉල්ලා සිටින්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ **සැබෑ අරුත** මුදුන් පමුණුවන ආකාරයට කටයුතු කරන ලෙයසි.

ගරු අග විනිසුරුතුමා සහ අනෙක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා විසින් මෙහිදි ජනතා පාර්ශවයන් හට ඉදිරිපත් වී කරුණු දැක්වීම සඳහා ඉඩකඩ සලසාදීම පිණිස ගන්නා ලද ක්‍රියාමාර්ගය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බෙහෙවින් අගය කරයි. මෙහිදි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරනය කර සිටින්නේ මීට පෙර මෙවැනි ඇතැම් අවස්ථාවන්හිදී නීතිපතිවරයාහට පමණක් එසේ කරුණු දැක්වීමට ඉඩකඩ ලැබුණු අවස්ථාවන් පැවැති බවයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රකාශ කර සිටින්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129(1) ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රියාදාමයන් විනිවිදභාවයකින් තොරව ක්‍රියා කිරීමට මඟ පාදා දිය හැකි බවයි. එසේ හෙයින් තම මතය ප්‍රසිද්ධියට පත් කිරීම තහවුරු කරමින් සිය තීරණය ලබාදෙන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගෞරව පූර්වකව ඉල්ලා සිටී.